(7) (3)

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY

අපේ අංකය:සං/01
2016.08.04

වගා සහනාධාර චක්‍රලේඛ අංක: 75

සියලුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත,

තේ නැවත වගාව සහ බෝග පුනරුත්ථාපනය (පාළු සැපයීම) යටතේ ගෙවනු ලබන දිරිදීමනා මුදල වැඩිකිරීම සඳහා 2010.12.31 දිනෙන් නිකුත් කරන ලද වගා ආධාර චක්‍රලේඛ අංක: 68 ඒ සඳහා සංශෝධන ඇතුළත් කිරීම. 2011.02.10

බෝග පුනරුත්ථාපන දිරිදීමනා ක්‍රමය යටතේ දිරිදීමනා ලබාගැනීමට කුඩා තේවතු හිමියන් ඉදිරිපත්වීමේ අඩුවීමක් පෙන්නුම්කරන බැවින් ඊට බලපා ඇති කරුණු සාකච්ඡා කිරීමේදී දැනට ක්‍රියාත්මකව පවතින කොන්දේසි සංශෝධනය වියයුතු බවට ප්‍රාදේශීය කළමණාකරුවන්ගේ රැස්වීම්වලදී අනාවරණය වීම නිසා අධ්‍යක්ෂමණ්ඩලයට කරුණු ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව අධ්‍යක්ෂමණ්ඩලය විසින් ලබාදුන් අනුමැතිය යටතේ වගා සහනාධාර චක්‍රලේඛ අංක: 68 ඒ - අංක 2 යටතේ සඳහන් (i) හා (ii) නියෝග අවලංගු කරන අතර, වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සංශෝධන බල පැවැත්වෙන බව මෙයින් දන්වමි.

(i). ඒකරාශි වූ හෝ විසිරි පාළු (තනි තනිව පවතින පාළු) සඳහා අක්කරයකට පැළ 1000 ක උපරිමය දක්වා ආධාර ලබා දෙනු ලැබේ.

(ii). පාළු සිටුවීම සඳහා ඉල්ලුම්කරන තේ වගාව අවම වශයෙන් පැළ සිටුවා වසර 04 ක් සම්පූර්ණ කර පළමුවන කප්පාදුවට එළඹ තිබිය යුතුය. තවද එම ඉඩම පුනරුත්ථාපනය කිරීම තුළින් ඉදිරි වසර 10 ක කාලය තුල සාර්ථක ලෙස අස්වැන්න ලබාගැනීමේ හැකියාව තිබිය යුතුය.

මෙම චක්‍රලේඛය ලද බවත් ඒ අනුව කටයුතු කරන බවත් සනාථ කලයුතු අතර, කාර්යමණ්ඩලය දැනුවත් කරමින් දන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීමද අවශ්‍ය වන බව වැඩිදුරටත් දන්වමි.

දේශබන්ධු විජේරත්න වගෙදර
සභාපති

පිටපත්:

1 සියලුම මාණ්ඩලික නිලධාරීන් (ප්‍රධාන කාර්යාලය/ප්‍රාදේශීය කාර්යාලය)
2 සියලුම කාර්යභාර නිලධාරීන්
3 සියලුම තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන්
4 ගරු ලේකම් - සමස්ත ලංකා සමිති සංවිධානය
5 සියලුම ප්‍රාදේශීය සංවිධානවල ගරු ලේකම්වරුන්